DP/AL/2024/2

මගේ අංකය : 6/3/AL/2024
පාසල් විභාග සංවිධාන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.
2024 ජූනි මස 13 දින

සියලු ම පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලා හා විදුහල්පතිවරුන් වෙත,

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2024**

2024 වර්ෂයට අදාල අ.පො.ස.(උ.පෙළ) විභාගය සඳහා පෙනී සිටීමට නියමිත පාසල් සහ පිරිවෙන් අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර සම්පූර්ණ කිරීමේ උපදෙස් මේ සමග එවමි. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය 2024.07.10 වේ. **කිසිඳු හේතුවක් මත හෝ අයදුම්පත්‍ර භාරගැනීමේ අවසන් දිනය දීර්ඝ කිරීමක් සිදු නොකෙරේ.**

(01) මාර්ගගතව (online) පමණක් ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කළ යුතු ය.

(02) අයදුම්කරුවන්ගේ තොරතුරු පද්ධතියට ඇතුළත් කිරීමට පෙර ඔබ පාසලට අයත් අතුරු මුහුණතෙහි (Profile) සඳහන් විදුහල්පතිගේ නම, පාසලේ ලිපිනය, දුරකථන අංක, අදාළ කොට්ඨාස/කලාප අධ්‍යාපන කාර්යාල අයත් ප්‍රදේශ හා විභාගය සඳහා පෙනී සිටින නගරය ආදී තොරතුරු යාවත්කාලීන කිරීම අනිවාර්ය වේ.

(03) ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කිරීම හා විෂයය තෝරාගැනීම ඉතාමත් නිවැරදිව සිදු කළ යුතුය. විෂයය අංක සහ මාධ්‍යයන් කිසිඳු හේතුවක් නිසා පසුව වෙනස් කරනු නොලැබේ. වැරදි විෂය ඇතුළත් කිරීම නිසා අයදුම්කරුවන්ට සිදුවන සියලු ම අපහසුතා පිළිබඳ වගකීම විදුහල්පති වෙත පැවරෙන අතර මේ සඳහා කටයුතු කිරීම වෙනුවෙන් විභාග දෙපාර්තමේන්තුවට වැයවන අතිරේක පිරිවැයක් වේ නම් අදාළ විදුහල්පතිගෙන් අය කරගනු ලැබේ.

> සැලකිය යුතුයි :
>
> අධ්‍යාපන ලේකම්ගේ 2008/43 චක්‍රලේඛයේ 4 වගන්තියට අනුව ප්‍රධාන මාධ්‍ය සිංහල හෝ දෙමළ ඉල්ලුම් කරන අයදුම්කරුවන්ට ඉංග්‍රීසි මාධ්‍යයෙන් අනුමත විෂයයන් කිහිපයක් සඳහා පෙනී සිටීමට පහසුකම් සලසා ඇත.

(04) පසුගිය වර ඔබ පිරිවෙණේ/පාසලේ අයදුම්කරුවන් පෙනී සිටි විභාග මධ්‍යස්ථානයට වඩා පහසු මධ්‍යස්ථානයක් අදාළ නගරයේ ඇත්නම් එය වෙනස් කර දෙන ලෙස අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශ සහිත ලිපියක් විභාග දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.

(05) අයදුම්කරුවන්ගේ **සම්පූර්ණ නම, අයදුම්කරන විෂයයන්, මාධ්‍යය** හා එහි දක්වා ඇති අනෙකුත් සියලුම තොරතුරු නිවැරදිව ඇතුළත් වී ඇත්දැයි පරීක්ෂා කරන ලෙසට අයදුම්කරුවන්ට උපදෙස් ලබා දෙන්න. මාර්ගගත ක්‍රමයට සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රයේ PDF format මුද්‍රිත පිටපතක් ලබාගෙන එහි සඳහන් සියලුම තොරතුරු නිවැරදි බවට තහවුරු කර ගෙන අයදුම්කරුවන්ගේ අත්සන් ලබාගෙන, විදුහල්පති අත්සන් කර අවශ්‍ය වුවහොත් පමණක් විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පාසලේ සුරක්ෂිතව තබා ගන්න.

(06) ඔබ විද්‍යාලයෙන් දෘශ්‍යාබාධිත/ශ්‍රවණාබාධිත/ වෙනත් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඔවුන් වෙනුවෙන් "Special Education Needs Students' Additional Data" සබැඳියේ ඇති තොරතුරු සම්පූර්ණ කළ යුතුය. මෙවැනි විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා ඇති සිසුන් වෙනුවෙන්

- රත්මලාන අන්ධ විදුහල, රත්මලාන
- පොළොම්මාරුව අඳ / බිහිරි විදුහල, තංගල්ල යන විද්‍යාලවල

විශේෂ විභාග මධ්‍යස්ථාන සහ වෙනත් සුදුසු මධ්‍යස්ථාන පිහිටුවනු ලබන බැවින් එම මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන්න.

U. L. A 6/15 Print UFdes

(07) අනන්‍යතාව ඔප්පු කිරීම

මෙම විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු ම තම අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම ඉදිරිපත් වන විට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතු ය. ජාතික හැඳුනුම්පත වෙනුවට ඉදිරිපත් කළ හැක්කේ වලංගු විදේශ ගමන් බලපත්‍රය හා වලංගු රියදුරු බලපත්‍රය පමණි. වෙනත් කිසිදු හැඳුනුම්පතක් වලංගු හැඳුනුම්පතක් ලෙස පිළිගනු නොලැබේ. එබැවින් ජාතික හැඳුනුම්පත සිසුන්ට ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දීම විදුහල්පතිවරුන්ගේ වගකීමකි.

සැලකිය යුතුයි :-

**මෙම විභාගය සඳහා අයදුම්පත් කැඳවන අවස්ථාව වන විට ජාතික හැඳුනුම්පත් නොමැති අයදුම්කරුවන් විභාග දෙපාර්තමේන්තුවට පැමිණ අප විසින් නිකුත් කරනු ලබන තාවකාලික හැඳුනුම්පත් අංකයක් ලබා ගැනීම අනිවාර්යය වේ. ඒ වෙනුවට වෙනත් බාහිර පුද්ගලයින්ගේ හැඳුනුම්පත් අංක භාවිතා කිරීම සපුරා තහනම් වන අතර එය ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේපවීමට හේතුවකි.**

(08) විභාගයට පෙනී සිටින වාරය

මෙම විභාගයට අයදුම්කර, එක ප්‍රශ්න පත්‍රයක එක කොටසකට හෝ පෙනී නොසිටින අයදුම්කරුවන් විභාගයට පෙනී නොසිටි අයදුම්කරුවන් ලෙස සලකනු ලැබේ. එවැනි අයදුම්කරුවන් සිටිනම් ඔවුන් පාසලින් පළමුවර ඉදිරිපත් කරන අයදුම්කරුවන් වශයෙන් සැලකිය හැකිය. පළමුවරට නිදහස් අයදුම්කරුවන් වශයෙන් ඉදිරිපත් කර, එක ද ප්‍රශ්න පත්‍රයක එක් කොටසකටවත් පෙනී නොසිටි අයදුම්කරුවන් පාසල මඟින් නැවත පාසල් අයදුම්කරුවන් වශයෙන් ඉදිරිපත් කිරීමේ දී ඔවුන් එසේ ඉදිරිපත් කිරීමට සාධාරණ වූ හේතු ඇති බවට විදුහල්පති විශේෂයෙන් වග බලා ගත යුතුයි.

විභාගයට පෙනී සිටිය ද නොසිටිය ද පාසලේ උසස් පෙළ පන්තියක අවුරුදු තුනකට වඩා රැඳී සිටි අයකු පාසල් අයදුම්කරුවකු වශයෙන් විභාගයට ඉදිරිපත් කළ නොහැකි ය. පෞද්ගලික අයදුම්කරුවන් ලෙස ඉල්ලුම්පත් ඉදිරිපත් කළ හැක්කේ පාසලෙන් දැනට අස්වීම් සහතිකය නිකුත් කර ඇති අයදුම්කරුවන්ට පමණි. පාසලේ සිටිමින් ම පෞද්ගලික අයදුම්කරුවන් ලෙස ඉල්ලුම්පත් ඉදිරිපත් කරන හෝ විභාගයට පෙනී සිටීමට උත්සාහ දරන හෝ විභාගයට පෙනී සිටින හෝ අයදුම්කරුවන් විභාග තහනමකට ලක් කරන අතර, ප්‍රතිඵල අත්හිටුවීම සහ ඒ පිළිබඳව නෛතිකව කටයුතු කිරීම ද සිදු කරනු ලැබේ.

(09) මෙම විභාගය සඳහා මාර්ගගතව (online) දත්ත ඇතුළත් කිරීම සම්බන්ධයෙන් තාක්ෂණික උපදෙස් මේ සමඟ ඇති ඇමුණුම 01 හි දක්වා ඇත. තවදුරටත් යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වුවහොත් පහත සඳහන් ලිපිනයෙන්, විද්‍යුත් තැපෑල මඟින් හෝ දුරකථන අංක මඟින් විමසීම් කළ හැකිය.


විභාග කොමසාරිස් ජනරාල්
පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
තැ.පෙ. 1903, කොළඹ.

විද්‍යුත් තැපෑල : gcealexam@gmail.com

දුරකථන අංක : 011-2784208
011-2784537
011-2786616

ෆැක්ස් අංක : 011-2784422

මාර්ගගත ඒකකය : 011-23671568
011-3661122

එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

## අයදුම්පත් සම්පූර්ණ කිරීමට අදාළ තාක්ෂණික උපදෙස්

**1. පද්ධතියට ප්‍රවේශ වීම**

1.1 අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ,

- නිල වෙබ් අඩවිය (https://doenets.lk) වෙත පිවිස "අපගේ සේවා" යටතේ ඇති "Exam Information Center" මත (Click) කර ඉන්පසු G.C.E. (AL) - 2024 Students Registration (School) මත (Click) කිරීම මගින් හෝ
- විභාග දෙපාර්තමේන්තුවේ නිල ජංගම දුරකථන යෙදවුම (mobile application) වන "DoE" වෙත පිවිස "මාර්ගගත අයදුම්පත් (පාසල් විභාග)" මත (Click) කර ඉන්පසු G.C.E. (AL) - 2024 Students Registration (School) මත (Click) කිරීම මගින් හෝ
  - https://onlineexams.gov.lk/eic වෙත පිවිසීමෙන් පසු,

1.2 G.C.E.(A/L) - 2024 Students Registration (School) තෝරන්න.

1.3 ලැබෙන ප්‍රවේශ කවුළුවේ, "School Account Login" වෙත පිවිස දැනටමත් ඔබට ලබාදී ඇති පරිශීලක නාම හා මුරපදය (school codeහා password) ඇතුළත් කර පද්ධතියට ප්‍රවේශ වන්න. (ඔබ පාසල වෙත ලබාදී ඇති school code හා password අස්ථානගත වී ඇත්නම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් එම තොරතුරු ලබා ගන්න. )

**2. පාසලේ මූලික තොරතුරු යාවත්කාලීන කිරීම**

2.1 පාසලේ මූලික තොරතුරු සම්පූර්ණ කිරීම සඳහා වම්පස මෙනුවෙහි ඇති School අයිකනය තෝරා ගන්න.

2.2 මෙහිදී ඔබගේ පාසලට අදාළ තොරතුරු පෙන්නුම් කරන අතර, එහි තොරතුරු අලුතින් ඇතුල් කිරීමට හෝ මේ වන විටත් ඇති තොරතුරු වෙනස් කිරීම සඳහා School Information tab මත Click කරන්න. ලැබෙන පෝරමයේ තොරතුරු සියල්ල නිවැරදිව සම්පූර්ණ කර Save Information බොත්තම Click කරන්න.

2.3 පාසල් අයදුම්කරුවන්ගේ තොරතුරු ඇතුළත් කිරීම සඳහා G.C.E.(A/L) Examination - 2024 යටතේ ඇති "Instruction" බොත්තම (Button) තෝරන්න.

2.4 උපදෙස් හොඳින් කියවීමෙන් සහ උපදෙස් වීඩියෝව නැරඹීමෙන් පසුව Next බොත්තම (Button) තෝරන්න.

**3. අයදුම්කරුවන්ගේ තොරතුරු ඇතුළත් කිරීම**

**3.1 පළමු ක්‍රමය - සියලු ම අයදුම්කරුවන්ගේ තොරතුරු එකවර ඇතුළත් කිරීම**

I. bulk upload මත click කරන්න.

II. Download Excel Template මත click කරන්න.

III. බාගත (download) වන Excel වැඩපතේ අයදුම්කරුවන්ට අදාළ තොරතුරු, දී ඇති උපදෙස්වලට අදාළව සම්පූර්ණ කරන්න.

IV. සම්පූර්ණ කරන ලද Excel වැඩ පත ගබඩා (save) කර ගන්න.

V. Browse අයිකනය භාවිතා කරමින් save කරගත් ගොනුව නිවැරදිව තෝරා ගන්න. upload අයිකනය භාවිත කරමින් තෝරාගත් ගොනුව උඩු ගත (upload) කරන්න.

VI. නිවැරදිව තොරතුරු උඩුගත වූ බවට පණිවුඩයක් දිස්වේ. එසේ නොමැති නම් ගොනු ආකෘතිය හා ඇතුළත් කළ දත්තයන් නැවත පරීක්ෂා කර බලන්න.

**3.2 දෙවන ක්‍රමය - එක් එක් අයදුම්කරුගේ තොරතුරු වෙන වෙනම ඇතුළත් කිරීම**

I. Add Candidate අයිකනය මත click කරන්න.

II. ලැබෙන කවුළුවට අයදුම්කරුගේ තොරතුරු ඇතුළත් කරන්න.

III. Date of Birth අයිතමය සම්පූර්ණ කිරීමේ දී එය තෝරා ගැනීමේ පහසුකම සපයා ඇත.

IV. ඊළඟ අයදුම්කරුගේ තොරතුරු සම්පූර්ණ කිරීම සඳහා Save Information අයිකනය මත click කරන්න.

V. මේ වන විට ඇතුළත් කර ඇති අයදුම්කරුවන්ගේ සියලු ම තොරතුරු ඔබට දිස්වනු ඇත.

**4. 2024 වසරේදී විභාගයට පෙනී සිටීමට නියමිත විෂයන් හා පෙනී සිටින මාධ්‍යය**

4.1 අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද 2016/13 හා 2016.04.26 දිනැති චක්‍රලේඛයට අනුකූලව විෂයයන් තෝරා ගත යුතුයි. එම චක්‍රලේඛයේ සම්මත විෂය ධාරාවලට අනුගත නොවන වෙනත් විෂය සංකලනයන් තෝරා ගත් අවස්ථාවලදී අයදුම්කරුවන් , නිශ්චිත විෂය ධාරාවකට අයත් නොවන (Non Stream), යනුවෙන් හඳුන්වා දෙන අතර විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේදී එම අයදුම්කරුවන් සඳහා දිවයින් තරාව (Island Rank) හා දිස්ත්‍රික් තරාව (District Rank) නිකුත් කරනු නොලැබේ. එම චක්‍රලේඛයට පටහැනිව විෂය සංකලන තෝරා ගැනීමෙන් අයදුම්කරුවන්ට මුහුණ පෑමට සිදු වන දුෂ්කරතා පිළිබඳ ව මෙම දෙපාර්තමේන්තුවට වගකීමක් නොමැති බව කාරුණිකව සලකන්න. මෙම අයදුම්කරුවන්ට නිවේදනයේ දක්වා ඇති විෂයය ලේඛනයෙන් තම විෂයයන් තෝරා ගත හැකි ය. මෙම විභාගය සඳහා හර විෂයන් තුනක් තෝරා ගත යුතු අතර, විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමට අපේක්ෂා කරනු ලබන්නේ නම් සාමාන්‍ය පොදු පරීක්ෂණයට ද පෙනී සිට සමත් විය යුතුයි. ඉහත විෂයන්ට අමතරව විෂයය අංක 13 සාමාන්‍ය ඉංග්‍රීසි විෂයට ද ඉල්ලුම් කළ හැකිය.

L. H A 6/15 Print

4.2 අවශ්‍ය නම් විභාගය සඳහා භාෂා මාධ්‍ය දෙකකින් පෙනී සිටිය හැක.

- සිංහල හා ඉංග්‍රීසි
- දෙමළ හා ඉංග්‍රීසි

මාධ්‍යන් දෙකකින් පෙනී සිටින විට ප්‍රධාන මාධ්‍යය සිංහල/දෙමළ ලෙස තෝරා ගත යුතු ය. කිසිවිටෙකත් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් එකවර විභාගයට පෙනී සිටිය නොහැක.

**4.3 ඉතා වැදගත් :**

i භෞතිය විද්‍යා විෂය ධාරාව යටතේ 07 ගණිතය විෂයට ඉල්ලුම් කළ නොහැකි ය.

ii විෂය අංක 14, 15, 16, 17, 18 හා 19 යන විෂයයන් අතුරෙන් එක් විෂයකට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

iii (65) ඉංජිනේරු තාක්ෂණවේදය හා (66) ජෛව පද්ධති තාක්ෂණවේදය යන විෂයයන් දෙකෙන් ඉල්ලුම් කළ හැක්කේ එක් විෂයකට පමණි.

iv (67) තාක්ෂණවේදය සඳහා විද්‍යාව විෂයට ඉල්ලුම් කළ හැක්කේ (65) ඉංජිනේරු තාක්ෂණවේදය විෂය හෝ (66) ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය හෝ ඉල්ලුම් කරන්නේ නම් පමණි.

v ආගම් හා ශිෂ්ටාචාර විෂයන් අතුරෙන් යම් ආගමක් තෝරා ගන්නේ නම් ඊට අදාළ ශිෂ්ටාචාර විෂය තෝරා ගත නොහැකි ය. එසේම ශිෂ්ටාචාර විෂයන් තෝරා ගන්නේ නම් ඊට අදාළ ආගම විෂය තෝරා ගත නොහැකි ය.

vi 52 නර්තනය විෂය ඉල්ලුම් කිරීමේදී ඔබ ඉගෙනුම ලැබූ නර්තන වර්ගය තෝරන්න.
**(එම වෙන් කර ගැනීම ප්‍රායෝගික පරීක්ෂණවලට පමණක් අදාළ වේ.)**

vii 54 - පෙරදිග සංගීත විෂය ඉල්ලුම් කළ හැක්කේ සිංහල මාධ්‍යයෙන් පමණි.

viii 55 - කර්ණාටක සංගීතය විෂය ඉල්ලුම් කළ හැක්කේ දෙමළ මාධ්‍යයෙන් පමණි.

ix 56 - බටහිර සංගීතය විෂය ඉල්ලුම් කළ හැක්කේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණි.

x ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරන ලද විෂයන් පසුව වෙනස් කිරීමට හෝ විභාග ශාලාවේ දී විෂයන් මාරු කිරීමට හෝ අමතර විෂයන්ට පෙනී සිටීමට හෝ ඉඩ දෙනු නොලැබේ. යම් හෙයකින් එසේ පෙනී සිටියහොත් එම අයදුම්කරුගේ ප්‍රතිඵල අවලංගු කිරීමට සිදුවනු ඇත.

4.4 **Common General Test**

සාමාන්‍ය පොදු පරීක්ෂණය : අයදුම්කරන්නේ නම් Common General Test ඉදිරියෙන් Yes යන්න තෝරා එයට අදාළ භාෂා මාධ්‍යය ද තෝරන්න. **(දෙවනවරට විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවකු නම් පෙර වර්ෂයේ ලකුණු 30ක් හෝ ඊට වඩා ලබා ඇත්නම් නැවත මෙම විෂයට පෙනී සිටීම අත්‍යාවශ්‍ය නොවේ.)**

4.5 **General English**

සාමාන්‍ය ඉංග්‍රීසි : අයදුම් කරන්නේ නම් General English ඉදිරියෙන් yes යන්න තෝරන්න.

4.6 විෂයන් තෝරා ගත් පසු අදාළ විෂයන් අයත් වන විෂය ධාරාව (Stream) ඔබට දර්ශනයවනු ඇත. ඒ පිළිබඳව ඔබගේ අවධානය යොමු කරන්න.

**5. දැනටමත් තොරතුරු ඇතුළත් කළ අයදුම්කරුවකුගේ තොරතුරු වෙනස් කිරීම**

අදාළ අයදුම්කරුගේ නම සහිත තීරුවේ ඇති "Edit" අයිකනය මත click කරන්න.

**6. අයදුම්කරුවකුගේ තොරතුරු සම්පූර්ණයෙන් ඉවත් කිරීම**

අයදුම්කරුගේ නම සහිත තීරුවේ ඇති Delete අයිකනය මත click කරන්න.

**7. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත අයදුම්කරුවන්ගේ තොරතුරු ඇතුළත් කිරීම**

7.1 විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත අයදුම්කරුවන්ගේ තොරතුරු ඇතුළත් කිරීම සඳහා තිරයේ වම් පසින් ඇති Special Needs Students' Additional Data හි ඇති Go to Data Form අයිකනය මත Click කරන්න.

7.2 එක් එක් අයදුම්කරු ඉදිරියෙන් ඇති Edit අයිකනය භාවිතා කර අදාළ අයදුම්කරුගේ පෞද්ගලික ලිපිනය (Private address), දුරකථන අංකය (Phone no.), ආබාධයේ ස්වභාවය (Disability type), ආබාධය පිළිබඳ විස්තර (disability details) සහ විශේෂ විභාග මධ්‍යස්ථානයක් අයදුම්කරන්නේ නම් එහි නම (If special center required) සම්පූර්ණ කරන්න.

**8. අයදුම්පත්‍රය මුද්‍රණය කර ගැනීම.**

- ඔබ පාසලේ සියලු ම අයදුම්කරුවන්ගේ දත්ත නිවැරදිව ඇතුළත් කර ඇතිදැයි පරීක්ෂා කර තහවුරු කරගත් පසු Print Data Form අයිකනය මත click කරන්න.
- ලැබෙන pdf ගොනුව නැවතත් පරීක්ෂා කර නිවැරදි බව තහවුරු කරගෙන මුද්‍රණය කරගන්න.
- වැරදි ඇතොත් අදාළ දත්ත වෙනස් කිරීමේ පහසුකම (Edit) භාවිත කර නිවැරදි කරගන්න.